**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය / Date: 2026.03.09 පැය 0620
දුරකථන අංකය / Tel.NO: 011-2887973
මගේ අංකය / My NO: D/Media/Out/ 415 /2026
විද්‍යුත් ලිපිනය / E-Mails: dir.media@police.gov.lk

**සමාජ මාධ්‍ය ජාලාවල සංසරණය වන වීඩියෝවකට අදාලව සැකකරුවෙකු අත්අඩංගුවට - නවගත්තේගම පොලිස් ස්ථානය .**

තරුණයින් දෙදෙනෙකු මාර්ගයේ ගමන් ගන්නා වාහන වලට බාධාවන අයුරින් අපරීක්ෂාකාරි ලෙස යතුරුපැදියක් ධාවනය කල වීඩියෝවක් සමාජ මාධ්‍ය ජාලාවල සංසරණය විය. මෙම වීඩියෝවට අදාලව සිදුකල විමර්ශනයේදී එම යතුරුපැදිය ආණමඩුව නවගත්තේගම මාර්ගයේ ආණමඩුව දෙසට ධාවනය කර ඇති බවට අනාවරණය වී ඇත.

2026.03.08 දින සවස් කාලයේ නවගත්තේගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එම යතුරුපැදිය ධාවනය කල පැදිකරු අපරීක්ෂාකාරි ලෙස හා අන්තරාදායක ලෙස යතුරුපැදිය ධාවනය කර මාර්ගයේ ගමන් ගන්නා වාහන වලට හා යතුරුපැදිකරුවන්ට අනතුරක් සිදුකර සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම යන චෝදනා යටතේ අදාල යතුරුපැදියද සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු  වයස අවුරුදු 19 ක් වන නවගත්තේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2026.03.09 අද දින ආණමඩුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති අතර නවගත්තේගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**